# ACCOUNTING FOR PARTNERSHIP (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය

හවුල් ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.

## ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය

හවුල් ව්‍යාපාරයක අයිතිය කිහිප දෙනෙකු සතු වන නිසා ශුද්ධ ලාභය හවුල්කරුවන් අතර බෙදාහැරීම කළ යුතු ය. (විසර්ජනය කළ යුතු ය.)

ඒ සඳහා පිළියෙළ කරනු ලබන ප්‍රකාශනය ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය නම් වේ.

හවුල් ගිවිසුමට අනුව ගිණුම් කාලච්ඡේදයට අදාළව ලාභාලාභ විසර්ජන ප්‍රකාශයනට පහත අයිතම ඇතුළත් කරනු ලැබේ.

- ප්‍රාග්ධන පොළිය
- හවුල් වේතන
- ලාභ / අලාභ කොටස්

ClassWork.LK

## ලාභාලාභ විසර්ජන ප්‍රකාශනයේ සටහන් කරන අයිතමවලට අදාළ ද්විත්ව සටහන

| | |
|---|---|
| ලාභාලාභ විසර්ජන ගිණුම | හර |
| ජංගම ගිණුම | බැර |

## හවුල්කරුවන්ට හිමි යම් ප්‍රමාණයක හිමිකමක් මුදලින් ලබා ගෙන ඇත්නම් ද්විත්ව සටහන

හවුල්කරුවන්ට හිමි යම් ප්‍රමාණයක හිමිකමක් ඔවුන් මුදලින් ලබා ගෙන ඇත්නම්, ජංගම ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කළ යුතුය.

ලාභාලාභ විසර්ජන ගිණුමේ ඇතුළත් අයිතමවල ද්විත්ව සටහන සම්පූර්ණ කිරීම සඳහා මෙන් ම, හවුල්කරුවන්ගේ විචල්‍ය හිමිකම පෙන්වීම සඳහා ජංගම ගිණුම් භාවිත කරයි.

Class Work LK

# ලාභාලාභ විසර්ජන ගිණුමේ ආකෘතිය

ලාභාලාභ විසර්ජන ගිණුම

රු.

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන පොළී | A | × | | ශුද්ධ ලාභ ඉ/ගෙ | ××× |
| | B | × | ×× | | |
| හවුල් වේතන | A | × | | | |
| | B | × | ×× | | |
| ලාභ කොටස් | A | × | | | |
| | B | × | ×× | | |
| | | | ××× | | ××× |

# ලාභාලාභ විසර්ජන ප්‍රකාශනයේ ආකෘතිය

ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය රු.

| | | | | |
|---|---|---|---|---|
| ශුද්ධ ලාභය | | | | ××× |
| ප්‍රාග්ධන පොළී | A | × | | |
| | B | × | ×× | |
| හවුල් වේතන | A | × | | |
| | B | × | ×× | (××) |
| ලාභ කොටස් | A | × | | |
| | B | × | ×× | (××) |
| | | | ××× | ××× |

ClassWork.LK

# නිදසුන්

2021/03/31 දිනෙන් අවසන් වර්ෂයේ ව්‍යාපාර දෙකක තොරතුරු පහත දැක්වේ.

| ප්‍රභා ව්‍යාපාරය (රු.000') | | | | රවී ව්‍යාපාරය (රු.000') |
|---|---|---|---|---|
| 1 000 | ප්‍රමිතා | ප්‍රාග්ධනය | රශ්මි | 1 200 |
| 800 | භාරත | | වින්දන | 1 000 |
| 200 | ප්‍රමිතා | ජංගම ගිණුම් | රශ්මි | 300 |
| 100 | භාරත | | වින්දන | 200 |
| 150 | ප්‍රමිතා | ගැනිලි | රශ්මි | 100 |
| 50 | භාරත | | වින්දන | 100 |
| 2 500 | -------- | විකුණුම් | --------- | 3 000 |
| 1 000 | --------- | විකුණුම් පිරිවැය | --------- | 1 300 |
| 200 | --------- | පරිපාලන වියදම් | --------- | 300 |
| 100 | --------- | බෙදාහැරීමේ වියදම් | --------- | 150 |
| 90 | --------- | වෙනත් වියදම් | --------- | 80 |
| 50 | --------- | මූල්‍ය වියදම් | --------- | 70 |
| 500 | ප්‍රමිතා | ව්‍යාපාරයට දුන් ණය | රශ්මි | 300 |
| 10% | --------- | ණය සඳහා පොළිය | --------- | - |
| 5% | --------- | ප්‍රාග්ධන පොළිය | --------- | - |
| 10 | --------- | හවුල් වේතන මසකට | | - |
| 700 | භාරත | හවුල් ව්‍යාපාරයෙන් ගත් ණය | --- | |
| 10% | --------- | ගත් ණය සඳහා පොළිය | --- | |
| 2 : 1 | ප්‍රමිතා : භාරත | ලාභාලාභ අනුපාතය | | --- |

ඉහත තොරතුරු ඇසුරෙන් ප්‍රභා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය, ලාභාලාභ විසර්ජන ගිණුම හා ජංගම ගිණුම පිළියෙළ කරන්න.

ClassWork.LK

# <u>ප්‍රභා හවුල් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන (ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය) තිරස් ක්‍රමයට</u>

ප්‍රභා ව්‍යාපාරය
2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
වෙළෙඳ හා ලාභාලාභ ගිණුම හා විසර්ජන ගිණුම /ආදායම් ප්‍රකාශනය

(රු.000')

| | | | | |
|---|---|---|---|---|
| විකුණුම් පිරිවැය | | 1 000 | විකුණුම් | 2 500 |
| දළ ලාභය ප/ගෙ | | 1 500 | | |
| | | 2 500 | | 2 500 |
| බෙදාහැරීමේ වියදම් | | 200 | දළ ලාභය ඉ/ගෙ | 1 500 |
| පරිපාලන වියදම් | | 100 | **වෙනත් ආදායම්** | |
| වෙනත් වියදම් | | 90 | ණය පොළී ආදායම | 70 |
| මූල්‍ය වියදම් | | | | |
| (ණය පොළිය -ප්‍රමිතා 50) | | 100 | | |
| ශුද්ධ ලාභය ප/ගෙ | | 1 080 | | |
| | | 1 570 | | 1 570 |
| ප්‍රාග්ධන පොළී - ප්‍රමිතා | 50 | | ශුද්ධ ලාභය | 1 080 |
| - භාරත | 40 | | | |
| හවුල් වේතන - ප්‍රමිතා | 120 | | | |
| - භාරත | 120 | 240 | | |
| ලාභ කොටස් | | | | |
| - ප්‍රමිතා | 500 | | | |
| - භාරත | 250 | 750 | | |
| | | 1 080 | | 1 080 |

ClassWork.LK

# ප්‍රභා හවුල් ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන (ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය) සිරස් ක්‍රමයට

ප්‍රභා ව්‍යාපාරය
2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය හා විසර්ජන ප්‍රකාශනය

(රු.000')

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 2 500 |
| **අඩු කළා :** විකුණුම් පිරිවැය | | | (1 000) |
| දළ ලාභය | | | 1 500 |
| **එකතු කළා :** වෙනත් ආදායම් | | | |
| ණය පොලී ආදායම | | | 70 |
| | | | 1570 |
| **අඩු කළා :** වියදම් | | | |
| බෙදාහැරීමේ වියදම් | 200 | | |
| පරිපාලන වියදම් | 100 | | |
| වෙනත් වියදම් | 90 | | |
| මූල්‍ය වියදම් | 100 | 490 | (490) |
| ණය පොලී - ප්‍රමිතා සමග) | | | |
| ශුද්ධ ලාභය | | | 1 080 |
| **අඩු කළා :** | | | |
| ප්‍රාග්ධන පොලී ..... ප්‍රමිතා | 50 | | |
| භාරත | 40 | 90 | |
| හවුල් වේතන ...... ප්‍රමිතා | 120 | | |
| භාරත | 120 | 240 | (330) |
| ලාභ කොටස් ............... ප්‍රමිතා | 500 | | |
| භාරත | 250 | 750 | (750) |
| | | | 0 |

ClassWork.LK

# හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

(රු)

| විස්තරය | ප්‍රමිතා | භාරත | විස්තරය | ප්‍රමිතා | භාරත |
|---|---|---|---|---|---|
| ගැනිලි | 150 | 50 | ශේෂය ඉ/ගෙ | 200 | 100 |
| ණය පොළී | - | 70 | ප්‍රාග්ධන පොළී හවුල් | 50 | 40 |
| ශේෂය ප/ගෙ | 770 | 390 | වේතන ණය පොළී | 120 | 120 |
| | | | ලාභ කොටස් | 50 | - |
| | | | | 500 | 250 |
| | 920 | 510 | | 920 | 510 |
| | | | ශේෂය ප/ගෙ | 770 | 390 |

ClassWork.LK

## අභ්‍යාස

(01) ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජන ගිණුමක් / ප්‍රකාශනයක් පිළියෙල කිරීම අවශ්‍ය වන්නේ ඇයි?

(02) පහත සඳහන් ගනුදෙනුවල ද්විත්ව සටහන් ලියා දක්වන්න.

ප්‍රාග්ධන පොළී A රු. 400
B රු. 200

හවුල්කරුවෙකු වූ කුමාරට ගෙවිය යුතු ණය පොළිය රු. 100

ClassWork.LK

(03) සුමනා හා යමුනා ගේ හවුල් ව්‍යාපාරයේ දෙන ලද තොරතුරු ඇසුරින් ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය පිළියෙල කරන්න.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | සුමනා | රු. 700 000 |
| | යමුනා | රු. 500 000 |

ප්‍රාග්ධන පොළිය වාර්ෂිකව 10%

| | |
|---|---|
| හවුල් වේතන සුමනාට වාර්ෂිකව | රු. 100 000 |
| හවුල් වේතන යමුනාට වාර්ෂිකව | රු. 80 000 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | රු. 200 000 |

ලාභාලාභ අනුපාතය හවුල්කරුවන් අතර සම සම වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura